# අර්බුදයට ප්‍රතිචාර ලෙස සම්පාදිත ප්‍රතිපත්ති සම්බන්ධයෙන් 2022 වසර තුළ ශ්‍රී ලංකා රජය විසින් දක්වන ලද කැපවීම පිළිබඳ ඇගයීම

PUBLIC FINANCE .lk

# මෙම ඇගයීම කුමක් ද?

2022 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික සහ දේශපාලන අර්බුදයේ උච්චතම අවස්ථාවේදී සම්පාදනය කරන ලද රජයේ අර්බුද ප්‍රතිචාර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ලා රජයේ කාර්ය සාධනය මෙම ඇගයීම මගින් අධීක්ෂණය කෙරේ. පුරවැසියන් හට දැඩි අසීරුතාවන්ට මුහුණ දීමට සිදු වූ ප්‍රධාන ක්ෂේත්‍ර 3ක් මෙම ඇගයීමේදී අධීක්ෂණය කරන ලදි.




Photo credits: AP

# එහි අරමුණ කුමක් ද?

කෙටියෙන් පවසන්නේ නම්, මෙම ඇගයීම යටතේ අධීක්ෂණය කරන ලද ප්‍රතිපත්ති කෙතරම් දුරට ක්‍රියාත්මක කර ඇත් ද යන්න පිළිබඳව මහජනතාවට තොරතුරු ලබා දීම එහි අරමුණයි.

- දුර්වල රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශ්‍රී ලංකාවේ අර්බුදය සඳහා බලපෑ ප්‍රධාන උත්ප්‍රේරකයක් විය.
- ආර්ථික ප්‍රතිසාධනය නාමයෙන් පුරවැසියන් පීඩාවට පත් කර බදු මුදල් ලබා ගන්නා බැවින් එම මුදල් වියදම් කරන ආකාරය දැනගැනීමට ඔවුන්ට අයිතියක් ඇත.
- අකාර්යක්ෂමතාව සහ වග නොවීම සම්බන්ධයෙන් රජය අඛණ්ඩව නරක නාමයක් ලබා තිබේ.



Photo credits: AP

PUBLIC FINANCE .lk

# අධීක්ෂණය කළේ මොනවා ද ?

ශ්‍රී ලංකාවේ අර්බුදය පුරවැසියන් විසින් වඩාත්ම අත්දකින ලද්දේ (1) අත්‍යවශ්‍ය ඖෂධවල හිඟය; (2) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල හිඟය / මිල වැඩිවීම (3) දීර්ඝ විදුලි කප්පාදු කිරීම්, ගෑස් හිඟය / මිල වැඩිවීම යන කරුණු 3 ඔස්සේ වන අතර වැඩිම පීඩනයක් එල්ල කරනු ලැබුණේ ද එම කරුණු 3 මගිනි. අපි මෙම අංශ සම්බන්ධයෙ ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණ සහ යෝජනා අධීක්ෂණය කළෙමු:

සෞඛ්‍යය සහ ඖෂධ

ආහාර සහ කෘෂිකර්මය

ඉන්ධන සහ බලශක්තිය

PUBLIC FINANCE .lk

# අධීක්ෂණය කළේ මොනවා ද?

| සෞඛ්‍යය සහ ඖෂධ | ආහාර සහ කෘෂිකර්මය | ඉන්ධන සහ බලශක්තිය |
|---|---|---|
| • දේශීයව නිපදවන ජීවානුහරිත ද්‍රව කුඩා පරිමා නික්ෂේපණ ද්‍රාවණ (Sterile Liquid Small Volume Parenteral – SLSVP injectables) රාජ්‍ය අංශය සඳහා මිලදී ගැනීම | • මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන 2021/22<br>• කාබනික පොහොර නිෂ්පාදන අංගනයක් ඉදි කිරීම<br>• කෘෂි බීජ නිවෙස්වලට බෙදා හැරීම<br>• වී ගොවියන් විසින් ලබා ගත් අක්‍රිය ණය කපා හැරීම<br>• රජයට අයත් හිස් ඉඩම් කෘෂිකාර්මික අරමුණු සඳහා භාවිතා කර ආහාර හිඟය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ කමිටු පත් කිරීම<br>• 2021/2022 මහ කන්නයේ හරිත කෘෂිකාර්මික යෙදවුම් භාවිතය සඳහා දිරි දීමනා ගෙවීමේ ක්‍රමවේදය<br>• 2022/23 මහ කන්නයේ වී වගාව සඳහා අවශ්‍ය රසායනික හා කාබනික පොහොර ප්‍රසම්පාදනය<br>• "එක්ව වවමු - රට දිනවමු " – 2022 වසරේ බෝග නිෂ්පාදනය සඳහා දියත් කරන ලද ජාතික වැඩසටහන<br>• බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය විසින් දියත් කරන ලද කෘෂිකාර්මික බෝග වගා වැඩසටහන් | • සපුගස්කන්ද තෙල් පිරිපහදුව සඳහා බොරතෙල් සැපයීම<br>• සැමට විදුලිය<br>• පුනර්ජනනීය බලශක්තිය භාවිතා කිරීම හරහා විදුලි බලය ජනනය කිරීම සම්බන්ධයෙන් ස්වයංපෝෂිත වීම<br>• ඉන්ධන මිල ඉහළ යාමෙන් පීඩාවට පත් ධීවර සහ ප්‍රවාහන ක්ෂේත්‍ර සඳහා විශේෂ සහන වැඩසටහන්<br>• අඩු ආදායම්ලාභී කණ්ඩායම්, වතු කම්කරුවන් සහ ධීවරයින් අතර භූමිතෙල් බෙදා හැරීමේ වැඩසටහන |

# අධීක්ෂණය කළේ මොනවා ද?

ඇගයීම මගින් 2022 වසරේ හඳුන්වා දුන් නියාමන යෝජනා සහ ප්‍රතිපාදන සහිත වියදම් යෝජනා ආවරණය කරන ලදි.

**2016** අංක **12** දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

- ක්‍රියාත්මක කිරීමේ කාල රේඛාව
- ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කරන ලද අරමුදල් පිළිබඳ විස්තර
- භෞතික සහ මූල්‍ය ප්‍රගතිය
- ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍ය අනෙකුත් අදාළ තොරතුරු

මුළු යෝජනා ගණන **15** කි

- කැබිනට් තීරණ
- හැන්සාඩ්

තුළින් එම යෝජනා තෝරා ගන්නා ලදි



PUBLIC FINANCE .lk

# අප එය අධීක්ෂණය කළේ කෙසේ ද ?

**රජය ඔවුන් කරන දේ පවසන්නේ ද?**

**- විවෘතභාවය -**

**රජය පවසන දේ කරන්නේ ද ?**

**- ප්‍රගතිය -**

| | |
|---|---|
| | සංවෘතයි |
| | සීමා කර ඇත |
| | විවෘතයි |


| | |
|---|---|
| | හෙළිදරව් නොකර ඇත |
| | දුර්වලයි |
| | අර්ධ වශයෙන් |
| | සැලකිය යුතු ලෙස |
| | සපුරා ඇත |

# සොයාගැනීම්

## 2022 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය අතරතුර යෝජනා කරන ලද ප්‍රතිපත්ති රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබුවේ ද?

PUBLIC FINANCE .lk

ප්‍රතිපත්ති හෙළිදරව් කරන ලද අතර, ක්‍රියාවට නැංවීම පිළිබඳ විස්තර සංවෘත විය




තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ වන ඉල්ලීම් ගොනු කළ පසු, ඊට ලැබුණේ ප්‍රතිචාර 3ක් පමණි (20%). එලෙස සපයන ලද තොරතුරු අතුරින් ප්‍රගතිය ඇගයීම සඳහා ප්‍රයෝජනවත් වූයේ ප්‍රතිචාර 1 ක් පමණි (7%).

# සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

## ප්‍රගතිය

**2022 ජූලි 4:** හෙක්ටයාර දෙකක් හෝ ඊට අඩු ප්‍රමාණයක ඉඩම්වල වී වගා කිරීම සඳහා රජයේ බැංකුවලින් ගත් සහ ගෙවීමට අපහසුව ඇති ණයවල මූලික ණය මුදල කපා හැරීමට ගන්නා ලද කැබිනට් තීරණය

**2022** අගෝස්තු **30**: රු .මි **. 688** ක් වන ගෙවීමට ඇති ණය කපා හැරීම සඳහා **2022** අතුරු අයවැය මගින් රු .මි **.350** ක් වෙන් කරන ලදී.

**2022** නොවැම්බර් **21:**

- භෞතික ප්‍රගතිය -ගොවීන් 28,259 ගෙන් 25,775 ක ගේ ණය **[91.21%]**
- මූල්‍ය ප්‍රගතිය - රු මි. 688 කින් රු.මි. 561 ක් කපා හැර ඇත **[81.54%]**

සමස්ත ප්‍රගතිය **- 86.38%**

## විවෘත බව

සපයන ලද තොරතුරු:

- කාල රේඛාව
- භෞතික ප්‍රගතිය
- මූල්‍ය ප්‍රගතිය

සම්පූර්ණයෙන් භාවිතයට ගත හැකි වය**[100%]**


නිසි කාල සීමා ඇතුළත ප්‍රතිචාර ලබා දීම පිළිබඳව:

- දින 14කට පසුව තොරතුරු ලැබුණු නමුත් එසේ ලැබුණේ තොරතුරු දැනගැනීමේ ඉල්ලීම ගොනු කිරීමෙන් දින 21ක් ඇතුළත ය

සතුටුදායකයි **[50%]**

සමස්ත විවෘත බව**- 75%**

PUBLIC FINANCE .lk




අධීක්ෂණය කරන ලද ප්‍රතිපත්තිවලින් 93% ක් කෙතරම් දුරට ක්‍රියාවට නංවා ඇත් ද යන්න පිළිබඳව තොරතුරු මහජනතාවට හෙළි කර නොමැත...

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන අමාත්‍යාංශ බොහොමයක් හට තම විෂය පථයට පැවරී ඇති යෝජනා සම්බන්ධයෙන් පැවතියේ වික්ෂිප්තභාවයක් වන අතර තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් ද එම අමාත්‍යාංශ විසින් නිසි ක්‍රියා පටිපාටිය නොපිළිපදින ලදි .

PUBLIC FINANCE .lk

# කෘෂිකර්ම අමාත්‍යාංශය

- 2022 නොවැම්බර් 4: තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉල්ලීම් 4ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ගොනු කරන ලදි
- 2022 නොවැම්බර් 22: තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ඉල්ලීම් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි
- 2022 නොවැම්බර් 25: තොරතුරු කෙටුම්පත් කිරීම සඳහා නිලධාරීන් පත් කරන ලදි - කෘෂි සංවර්ධන අතිරේක ලේකම් සහ අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
- 2022 දෙසැම්බර් 14: තොරතුරු නිලධාරියා සම්බන්ධ කරගැනීමට නොහැකි වූ අතර තොරතුරු නොලැබිණි.

| | |
|---|---|
| තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ප්‍රතිචාර භාර ගැනීම සඳහා වෙන් කරන ලද කාල සීමාව | **2022** නොවැ **4** - දෙසැ **16** (වැඩ කරන දින **28**) |
| පසු විපරම් උත්සාහයන් | **x7** |
| ඇමතුම්වලට ප්‍රතිචාර | **x5** |
| ඉටු නොකරන ලද පොරොන්දු | |

PUBLIC FINANCE .lk

# වී අලෙවි මණ්ඩලය

- 2022 නොවැ 4: තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉල්ලීම් 3ක් ගොනු කරන ලදි
- 2022 නොවැ 15- දෙසැ 8 : (බොරුවට) තොරතුරු ලබා දෙන බවට සහතික කිරීම
- 2022 දෙසැ 13: තමන්ගේ විෂයපථයට අයත් වන්නේ එක් ඉල්ලීමක් පමණක් බව දැනුම් දෙනු ලැබීය
- 2022 දෙසැ 15: තොරතුරු නිලධාරියා සම්බන්ධ කරගැනීමට නොහැකි වූ අතර තොරතුරු නොලැබිණි

| | |
|---|---|
| තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ගොනු කරන ලද ප්‍රතිචාර භාර ගැනීම සඳහා වෙන් කරන ලද කාල සීමාව | **2022** නොවැ **4** - දෙසැ **16** (වැඩ කරන දින **28)** |
| පසු විපරම් උත්සාහයන් | **x7** |
| ඇමතුම්වලට ප්‍රතිචාර | **x6** |
| ඉටු නොකරන ලද පොරොන්දු | [illegible] |

PUBLIC FINANCE .lk

# මේ අයුරින් වගවීම් රහිත බවක් පැවතීම සැලකිය යුතු තරම් වැදගත් වන්නේ ඇයි?



PUBLIC FINANCE .lk

## 01

2022 ශ්‍රී ලංකාවේ පවත්වන ලද මහජන විරෝධතාවල මූලික ඉල්ලීම්වලින් එකක් වූයේ මහජන මුදල් භාවිතය සහ කළමනාකරණය සම්බන්ධයෙන් රජයේ වගවීම සහ විනිවිදභාවය ඉහළ නැංවීමයි. අර්බුද, පුරවැසියන්ගේ දුක් වේදනා සහ මහජන ඉල්ලීම් හමුවේත් ප්‍රතිපත්ති සම්පාදකයින් සහ නිලධාරීන් තම ක්‍රියාකලාපයන් වෙනස් කිරීමට දක්වන නොකැමැත්ත ප්‍රශ්නකාරී වේ.

## 02

මහජනතාවගේ පහසුව සඳහා කටයුතු කිරීම සියලුම අමාත්‍යාංශවල සහ රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රධාන වගකීම බවත්, කිසිවෙකුත් අපහසුතාවයට පත් නොවන පරිදි කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා සියලුම අමාත්‍යාංශවල ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහනක් නිර්මාණය කිරීම අනිවාර්ය බවත් 2022 සැප්තැම්බර් මාසයේදී ජනාධිපති ලේකම් සමන් ඒකනායක මහතා විසින් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දැනුම් දෙන ලදි.

## 03

**2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගැසට් කරනු ලැබුවේ** වත්මන් ජනාධිපතිවරයා අගමැතිව සිටි **යහපාලන රජය සමයේදී ය**. එබැවින්, තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉල්ලීමක් ගොනු කිරීමෙන් අනතුරුව පවා හෙළිදරව් කළ යුතු තොරතුරු හෙළිදරව් නොකිරීම හේතුවෙන් එම පනත හෑල්ලුවට ලක් කෙරෙන බවක් පෙනී යන අතර එය ප්‍රශ්නකාරී වේ.

# කිසිදු වෙනසක් නොමැතිව රජය පෙර පරිදිම කටයුතු කරන්නේ නම් තිරසර ආර්ථික ප්‍රතිසාධනයක් සාක්ෂාත් කරගත හැක්කේ කෙසේ ද?

විනිවිදභාවය සහ වගවීම නොමැතිකම හේතුවෙන් මහජන අවිශ්වාසය ගොඩ නැඟෙන අතර, අර්බුදය සඳහා ප්‍රධාන උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කළ බලය සහ මහජන මුදල් ආශ්‍රිත අනිසි භාවිතය සඳහා ද එමගින් ඉඩ සැලසේ.

PUBLIC FINANCE .lk